සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 08 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

| | |
|---|---|
| 1 - 1 | 11 - 2 |
| 2 - 2 | 12 - 2 |
| 3 - 3 | 13. - 3 |
| 4 - 4 | 14. - 1 |
| 5 - 1 | 15. -1 |
| 6 - 4 | 16.- 1 |
| 7 - 4 | 17. - 4 |
| 8 - 2 | 18. - 1 |
| 9 - 3 | 19. -4 |
| 10 - 3 | 20.- 4 |

(ලකුණු 2 x 20 = 40)

01.

i. ප්‍රජාපතී ගෝතමිය
ii. නන්ද හාමුදුරුවෝ
iii. 06
iv. පිරිත් ආරාධනාව
v. දමනය කළ නොහැකි පුද්ගලයින් දමනය කිරීමේ ගුණය
vi. සිගාලක ගෘහපතියාට
vii. උම්මග්ග ජාතකය
viii. දුක්ඛ ආර්ය සත්‍යය
ix. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා
x. නිග්‍රෝධ කුඩා ස්වාමීන් වහන්සේ

(ලකුණු 2 x 10 = 20)

02.

i. අරහං බුදු ගුණය, සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න ගුණය, සුගත ගුණය, ලෝකවිදූ ගුණය, අනුත්තර පුරිස දම්ම සාරථී ගුණය, සත්ථා දේවමනුස්සානං ගුණය, බුද්ධ ගුණය, භගවා ගුණය

i. මුහුණ දොවා දැත් පිරිසිදු කර උචිත ඇඳුමකින් සැරසීම. බුදු පිළිමයක් ඉදිරිපස මල් පහන් පුදා දෝත් මුදුන් දී පංචශීලය සමාදන් වීම. පහසු ඉරියව්වකින් තැන්පත් වීම.

ii. බුදුරජාණන් වහන්සේ පිළිබඳව අසීමිත පැහැදීමක් ඇති වීම.
පාපයට ලැජ්ජාව හා බිය ඇතිවීම.
සිත තුළ පවතින දරදඬු ඕලාරික ගති ස්වභාවයන් යටපත් වීම.
රාග ද්වේශ මෝහ සිතුවිලි යටපත් වීම

(05 පාඩමේ 34 පිටුවේ ඇති කරුණුවලට අදාළ විස්තර)

03.

i. තොටගමුවේ ශ්‍රී රාහුල හිමිපාණන් විසින්
ii. පෙකනිය නොදක්වා - සළු ඇද බොලට දක්වා
නොපව තන සක්වා - සිනා නොමසෙන් දසන් දක්වා
iii. අප ආහාර ගන්නා විට අනුගමනය කළ යුතු යහපත් සිරිත් සමූහයක් ඇත. නොකළ යුතු ක්‍රියාවන් රාශියක් ඇති අතර එම නොකළ යුතු ක්‍රියාවන් සිදු නොකර ආහාර ගත යුතුය. (8 පාඩම 56 පිටුවේ කරුණු වලට අදාලව ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න)

04.

i. උපාලි ගෘහපතියා ගේ කතාව

ii. පිංතාලි තැබීම, අම්බලම් සැකසීම, මංමාවත් එකමුතු කමින් සකස් කිරීම

iii. පෙළ පොතේ 12 පාඩම ඇසුරෙන් ජාති, ආගම්, කුල, දුප්පත් පොහොසත් ආදී භේදවලින් තොරව එකමුතුව, ප්‍රිය වචන කථා කරමින්, පරිත්‍යාගශීලීව, ආගමික, ජාතික සහනසිලීතාවයෙන් යුතුව කටයුතු කිරීම තුළින් සහජීවනය උදා කර ගත හැකි ආකාරය විස්තර කර ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න.

05.

i. කුසල කර්ම - අකුසල කර්ම

i. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාම මිත්‍යාචාරය හෝ සතුන් මැරීම, සොරකම් කිරීම, වැරදි කාම සේවනය

ii. පෙළ පොතේ 15 පාඩම අනුව ශිෂ්‍ය ජීවිතය යහපත් කර ගැනීම සඳහා කුඩා කල සිට යහපුරුදු ජීවිතයට එක්කර ගැනීම කළ යුතුය. පැහැදුණු මනසින් කරන කියන දේ නිසා සැප විපාක ලැබේ. එම නිසා තමාට හානියක් සිදුවන අනුන්ට හානියක් සිදුවන, තමාටත් අනුන්ටත් හානියක් සිදුවන ක්‍රියා සිදු නොකළ යුතු අතර තමාටත් අනුන්ටත් යහපතක් සිදුවන ක්‍රියා කළ යුතු බව පැහැදිලි කර ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න.

06.

i. යෝ ච පුබ්බේ පමජ්ජිත්වා - පච්ඡා සෝ නප්පමජ්ජති
සෝ ඉමං ලෝකං පභාසේති - අබ්භා මුත්තෝව චන්දිමා

ii. යම් කෙනෙක් මුලදී පමා වුවත් පසුව නුවණින් විමසා බලා නොපමාව කටයුතු කරන්නේ නම් හෙතෙම වලා ගැබින් මිදුණු පුන් සඳක් මෙන් මේ මුලු ලෝකයම බබළවයි.

iii. නිරන්තරවම මළු පෙත් ඇමදීම පමණක් කළ සම්මුඤ්ජනී තෙරුන් වහන්සේට රේවත තෙරණුවෝ කළ "ඇවැත්නි වත් පිළිවෙත් පුරනවා යැයි නිතරම මලුව ඇමදීම පමණක් නොකළ යුතුය. උදෑසනම ඇමද දත් වළඳා, භාවනා කළ යුතුය... යන අවවාදය දීමෙන් පසු එම අවවාදය අනුව කටයුතු කිරීමෙන් රහත් බව ලබා ගත්හ.(07 පාඩම 49 පිටුව)

07.

i. චූල්ලපන්ථක හා මහා පන්ථක හිමියන් සහෝදරයන්, චූල්ල පන්ථක හිමියන්ට කොපමණ පාඩම් කළත් මතක තබා ගැනීමට නොහැකිය. සහෝදර ස්වාමීන් වහන්සේගේ උපදෙස් අනුව ගෙදර යාමට යන ගමනේදී බුදුරජාණන් වහන්සේගේ උපදෙස් අනුව භාවනා කර රහත් භාවය ලබා ගන්නා ලදී. ( 1 පාඩම 5 පිටුව )

ii. බුදුරජාණන් වහන්සේ ආගන්තුකව එන කෙනෙකුට සංග්‍රහ කරන ආකාරය 2 පාඩමේ 12 සහ 13 පිටු ආශ්‍රයෙන් ලියා ඇති පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

iii. 14 පාඩමේ 97 පිටුව තොරතුරු වලට අනුව පස්කම් සැපතෙහි ඇල්ම හෙවත් ඉඳුරන් පිනවීමේ ආශාව කාම තණ්හාවයි ඉන්ද්‍රියයන් ගෙන් ලබාගන්නා අරමුණු වලින් පිනවීමට ඇති කැමැත්ත කාම තණ්හාව ලෙස හඳුන්වා ඇත. (14 පාඩම 97 පිටුව)

iv. සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසුව සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචන හේතු කොටගෙන මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙන් රහතන් වහන්සේලා පන්සිය නමකගේ සහභාගිත්වයෙන් රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්ත පර්ණි ගුහාවේ දොරටුව අභියස පවත්වන ලදී.
( 18 වන පාඩම 122, 123 පිටු බලන්න)